# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1996/30 - 2016 දෙසැම්බර් මස 07 වැනි බදාදා - 2016.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: එම්සීයූඩීපී/සීඑම්සී/එම්ඩී/සීජ්/පී4.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/8/2015/පීසී/252.

කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන උපව්‍යාපෘතියක් වන මරදාන ප්‍රදේශයේ පිහිටි නොරිස් ඇළ මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරාගෙන අත්කර ගැනීමට ඇති බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුදුවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් මරදාන ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2016.12.02 දින සහතික කරන ලද අංක නො. 9669 දරන මූලික පිඹුරේ අංක 1, 2 සහ 3 වශයෙන් පිළියෙල කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0217 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි.

1. කැබලි අංක 1
ඉඩමේ නම: ටී. බී. ජයා මාවතේ වරිපනම් අංක 338 (කොටසක්); වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර 0.0002.

2. කැබලි අංක 2
ඉඩමේ නම: ටී. බී. ජයා මාවතේ වරිපනම් අංක 338 (කොටසක්); වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර 0.0001.

3. කැබලි අංක 3
ඉඩමේ නම: ටී. බී. ජයා මාවතේ වරිපනම් අංක 338 (කොටසක්); වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; විස්තරය: ස්ථිර ගොඩනැගිලි දෙකක කොටස් සහ මුර කුටියක් ඇත; හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර 0.0214.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් ඇති හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් 28 වැනි දින පෙ. ව. 9.30 ට කොළඹ මහා නගර සභාවේ පිහිටි මගේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 දෙසැම්බර් මස 20 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්, අත්කර ගැනීම සඳහා වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එම මුදල ගණනය කර ඇති ආකාරය පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වී. කේ. ඒ. අනුර,
නාගරික කොමසාරිස් සහ
කොළඹ මහා නගර සභාවේ බලතල,
කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි
හා ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරි,
කොළඹ මහා නගර සභාව.

12-862

1A - PG 3271 - 22 (2016/12)
මෙම අති විශේෂ *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.